# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2385/03 - 2024 මැයි මස 20 වැනි සඳුදා - 2024.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 15 (11) වන වගන්තිය යටතේ වන රීති.

**පී. නන්දලාල් වීරසිංහ,**
ශ්‍රී ලංකා මහ බැංකු පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.
2024 මැයි මස 17 වැනි දින.

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු පත් කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා නම් කිරීම සඳහා වන රීති

1. මෙම රීති "2024 අංක 01 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු පත් කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා නම් කිරීම සඳහා වන රීති" ලෙස හැඳින්විය යුතු ය.

2. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ (මින්මතු "මෙම පනත" ලෙස හඳුන්වනු ලබන) 15 (11) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව කටයුතු කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු පත් කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ (මින්මතු "මහ බැංකුව" ලෙස හඳුන්වනු ලබන) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා නම් කිරීමට අදාළ වන රීති මෙයින් නිකුත් කරනු ලැබේ.

3. අනුමත නියෝජ්‍ය අධිපතිවරුන් සංඛ්‍යාව සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා නම් කිරීම මෙම පනතේ 15 (8) වගන්තිය ප්‍රකාර ව තීරණය කළ යුතු වේ.

1A - G 41961 — 24 (2024/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. යම් නියෝජ්‍ය අධිපති ධුරයක් පුරප්පාඩු වන අවස්ථාවක දී මහ බැංකුවේ මානව සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් පාලක මණ්ඩලයෙහි අනුමැතිය සහිත ව නියෝජ්‍ය අධිපති ධුරය සඳහා අභිලාෂයන් (Expressions of Interest) කැඳවිය යුතු ය.

5. නියෝජ්‍ය අධිපති ධුරය සඳහා අභිලාෂයන් කැඳවන අවස්ථාවේ දී සේවයේ නියුතු සියලු සහකාර අධිපතිවරුන් නියෝජ්‍ය අධිපති ධුරය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන අතර සහකාර අධිපති ධුරයේ අවම වශයෙන් දෙවසරක සේවා කාලයක් සැපිරූ නිලධාරීන් සඳහා වැඩි මනාපයක් හිමි වේ.

6. මෙම ධුරය සඳහා තෝරා ගැනීම මහ බැංකු අධිපතිවරයා සභාපතිත්වය දරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන අවස්ථාවේ පාලක මණ්ඩලයේ සිටින පත් කළ සාමාජිකයන්ගෙන් අවම වශයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සාමාජිකයෙකුගෙන් (පාලක මණ්ඩලයේ පත් කළ සාමාජිකයෙකු නොවන) එම මණ්ඩලය සමන්විත විය යුතු ය.

7. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨත්වය, රැකියාව ආශ්‍රිත පළපුරුද්ද සහ වෘත්තීය වාර්තා, ධුරය සඳහා යෝග්‍ය බව (නායකත්ව ගුණාංග, පෞද්ගලික ගුණාංග සහ සන්නිවේදන කුසලතා) හා මහ බැංකුව සහ රට කෙරෙහි එම අපේක්ෂකයා සතු දැක්ම ඇතුළු ඇගැයීම් නිර්ණායක මත පදනම් ව අපේක්ෂකයන් ඇගැයීමට ලක් කෙරෙනු ඇත. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින් ඉහත සඳහන් ගුණාංග/ ඇගැයීම් නිර්ණායක අපේක්ෂකයන් වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

8. නියෝජ්‍ය අධිපති ධුරයට පත් කිරීම සඳහා වඩාත් සුදුසු නිලධරයා පිළිබඳ නිර්දේශය, නිර්දේශිත නිලධාරියාගේ අදාළ සියලුම විස්තර ද සහිත ව, පාලක මණ්ඩලය විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත ඔහුගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

9. මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ධුරය පුරප්පාඩු වීමට අවම වශයෙන් වැඩ කරන දින හතකට (7) පෙර, පාලක මණ්ඩලය විසින් මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා ලෙස නම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨතම නියෝජ්‍ය අධිපතිගේ නම මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත නිර්දේශ කළ යුතු ය.

10. මහ බැංකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ධුරය අනපේක්ෂිත ලෙස පුරප්පාඩු වන අවස්ථාවක දී, එලෙස එම ධුරය පුරප්පාඩු වූ දිනයේ සිට වැඩ කරන දින තුනක් (3) ඇතුළත 9 වන රීතියෙහි දක්වා ඇති නිර්දේශය සිදු කළ යුතු ය.

EOG 05 - 0148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.